# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

සිංහල භාෂා සම්ප්‍රදාය හා කලා ශිල්ප- **SINH 28224**

සැම කොටසකින්ම අයත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. 'සිංහල භාෂාව ඉන්දු-ආර්ය භාෂා ගණයට අයත් වූවකි.' සසාධකව විභාග කරන්න.

02. සිංහල ප්‍රාකෘත අවධියේ ප්‍රධාන භාෂා ලක්ෂණ මොනවාදැ යි පරීක්‍ෂා කරන්න.

03. මධ්‍යතන සිංහල අවධියේ භාෂා පරිණාමීය සාධක කෙරෙහි සාවධාන වෙමින් මිශ්‍ර සිංහලයේ භාෂා ලක්ෂණ හඳුන්වා දෙන්න.

    නැතහොත්

    අපරදිග සංස්කෘතික සංස්පර්ශයේ බලපෑම නූතන සිංහල භාෂාවෙහි ප්‍රතීයමාන වන අයුරු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

### II කොටස

04. සිදත් සඟරාවේ නිර්දිෂ්ට අක්ෂරමාලාව පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

05. සිදත් සඟරාවේ ඉගැන්වෙන සන්ධි විග්‍රහය පිළිබඳ විවරණයක් ඉදිරිපත් කරන්න.

06. 'සිංහල භාෂාවේ ලිංග වර්ගීකරණය පිළිබඳ සිදත්කරුගේ ඇතැම් ඉගැන්වීම් ගැටලු සහගතය' මෙම ප්‍රකාශයෙහි යුක්තියුක්තතාව පරීක්‍ෂා කරන්න.

07. සිදත් සඟරාවට අනුව 'ක්‍රියා' ව්‍යාකරණාංගය පැහැදිලි කර, අන්‍යකාරක ක්‍රියා නිදසුන් දෙමින් විස්තර කරන්න.

### III කොටස

08. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධිය මෙරට දෘශ්‍ය කලාවේ ආරම්භය සනිටුහන් කරන අයුරු සමාලෝචනය කරන්න.

09. 'දීර්ඝකාලීනව පැවතගෙන ආ මෙරට චිත්‍ර සම්ප්‍රදායයෙහි විධිමත් සංස්ථාපනය දැකියහැකි වන්නේ සීගිරි චිත්‍රවලිනි' මෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

    නැතහොත්

    'මහනුවර යුගයේ චිත්‍රවලින් පිළිබිඹු වන්නේ ආගමික තොරතුරු සන්නිවේදනය කිරීම කෙරෙහි දැක්වූ ප්‍රමුඛ අවධානයයි' සසාධකව පැහැදිලි කරන්න.

10. 'ස්තූපය යනු බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ විශිෂ්ටතම කලා නිර්මාණයයි' සනිදර්ශන ව විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)